# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1889/48 - 2014 නොවැම්බර් මස 21 වැනි සිකුරාදා - 2014.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත**

5 වැනි වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින්, එම වගන්තිය යටතේ 2014 සැප්තැම්බර් 01 වැනි දින අංක 1878/3 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* මඟින් අවසන් වරට සංශෝධිත 2006 ඔක්තෝබර් 05 වැනි දින අංක 1465/20 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය පහත උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2014 නොවැම්බර් මස 21 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

1. එම උපලේඛනයේ 32 වැනි අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමෙන් :-

   "2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වැනි වගන්තිය මගින් නියම කෙරෙන පරිදි, දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වෙනම සමාගම් දෙකක් ලෙස වෙන්කොට හඳුනාගැනීමට අනුකූලව සහ හෝ ඒ හා සම්බන්ධව රක්ෂණ සමාගමක් විසින් නිකුත් කරනු ලබන යම් කොටස් සහතිකයක්.".

2. මෙම උපලේඛනයේ 32 වැනි අයිතිමයට පසුව ඉනික්බිතිවම පහත සඳහන් නව අයිතමය එකතු කිරීමෙන් :-

   "මූල්‍ය අංශ ඒකාබද්ධ ක්‍රියාවලිය යටතේ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවක්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී යම් මූල්‍ය සමාගමක් හෝ 2000 අංක 56 දරන කල්බදු සමාගම් පනත යටතේ බලපත්‍රලාභී කල්බදු සමාගමක්, ඒකාබද්ධ කිරීමේ, අත්පත් කර ගැනීමේ හෝ අන්තර්ග්‍රහණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිකුත් කරන ලද යම් කොටස් සහතිකයක් ".

12-678